# දේශපාලන බලය සඳහා තරග නොකරන පක්ෂයක්

සරත් ප්‍රනාන්දු

## දේශපාලන බලය සඳහා තරග නොකරන පක්ෂයක්

අද අපේ රටේ තියෙන සියලුම දේශපාලන පක්ෂ රටේ දේශපාලන බලය සඳහා තරග වදින තමන් රටේ දේශපාලන බලය සඳහා පත්කරන්නැයි ජනතාවගෙන් ඉල්ලා සිටින පක්ෂ වේ. එසේ ඉල්ලා නොසිටින පක්ෂයක් දේශපාලන පක්ෂයක් සේ සලකනු ලබන්නේ ද නැත.

එහෙත් එවැනි පක්ෂ තිබිය හැකි ද? එවැනි පක්ෂ ගොඩනැඟිය හැකි ද? ඒවායේ අරමුණු හා පරමාර්ථ මොනවා විය හැකි ද? යනාදී කරුණු සලකා බැලීම වටී.

දේශපාලනය යනු රටේ පවතින පාලනය කෙරෙහි බලපෑමයි. රටේ පාලනය කෙරෙහි බලපෑම සඳහා රටේ දේශපාලන බලය ලබාගැනීම අත්‍යවශ්‍ය සාධකයක් නොවේ. ඇත්තෙන්ම රටේ පාලනය කෙරෙහි බලපෑම සාමාන්‍ය ජනතාව සතු අයිතියකි. වගකීමකි. දැනට සිදුවන්නේ පාලනය කෙරෙහි බලපෑම සඳහා මහජනතාව විසින් තම නියෝජිතයින් ඡන්දයෙන් පත්කරගැනීමයි. එසේ පත්කරගනු ලබන නියෝජිතයින් මහජනතාවගේ ඉල්ලීම් හා යෝජනා සම්බන්ධව රටේ පාලනයට බලපානු ඇතැයි විශ්වාස කෙරේ. එහෙත් බෙහෙවින් සිදුවන්නේ එය නොවේ. බලය ලබාගන්නා තුරු මහජනතාවට පොරොන්දු දීම හා මහජන කැමැත්තට අනුව කටයුතු කරන බව පෙන්වීම සිදුවන නමුදු, බලය ලබාගත් පසුව එම පොරොන්දු ඉටුකිරීම හෝ මහජන ඉල්ලීම හා අවශ්‍යතා වලට සංවේදී වීම සිදුනොවන තරම් ය. එබැවින් මහජනතාව තම දේශපාලන ශක්තිය පාවිච්චි කරනුයේ යම් පක්ෂයක් බලයට පත්කරගැනීමට පමණි. ඒ පක්ෂය බලයට පත්වූ දා සිට මහජනයාට එම පක්ෂය කෙරෙහි ඇති බලපෑම අවසන් වේ. එතැන් සිට සිදුවන්නේ මහජනතාවට, එනම් ඡන්ද දායකයින්ට තමන් බලයට පත් කළ පාලනයට යටත්ව, අවනතව සිටීමට ය. බලයට පත්වූ අයට පාලනය කරන කාලය තුළ මහජනතාවට වගකියන ආකාරය ගැන ප්‍රශ්න කිරීමට තැනක් නැත. ඔවුන් වගනොකියන්නේ නම් ඒ ගැන උත්තර බැඳීමට පත්වූ නියෝජතයින් බැඳී නැත. මේ තත්ත්වය නිසා බලය ලබාගත් අයට හා ඒ අයගේ ආණ්ඩුවට දූෂණය වීමට ඇති ඉඩකඩ බොහෝ ය.

මේ තත්ත්වය නිසා අද පවතින බොහෝ පාලනයන් බලය ලබාගැනීම සඳහා එකක් කියයි. බලය ලබාගත් පසුව ඊට හාත්පසින්ම වෙනස් දෙයක් කරති. ඊළඟ මැතිවරණයේ දී යලිත් බලය ලබාගැනීම සඳහා තව බොරු පොරොන්දු රාශියක් දෙති.

## අද අවශ්‍ය දේශපාලනය කුමක්ද?

මේ අනුව අද අවශ්‍යව ඇති දේශපාලනය කුමක්ද? යන්න සිතා බලමු. ''ප්‍රජාතන්ත්‍රවාදය'' යනුවෙන් අර්ථ දක්වනු ලබන්නේ ''මහජනතාව විසින්, මහජනතාව සඳහා පවත්වාගෙන යනු ලබන මහජන පාලනයක්'' ලෙසයි. අද අවශ්‍යව ඇත්තේ සැබවින්ම එබඳු පාලනයක් ඇති කිරීම සඳහා අවශ්‍ය දේශපාලනයකි. එබඳු පාලනයක් ඇති කිරීම සඳහා මහජනතාව කුමක් කළ යුතු ද? ප්‍රථමයෙන්ම අවශ්‍ය වන්නේ තම සුබසිද්ධිය සඳහාත්, සාධාරණය සඳහාත් අවශ්‍ය මොනවාද? යන්න වටහාගැනීමයි. මහජනයාට එනම්, සියල්ලන්ට ආහාර අවශ්‍යය, නිරෝගීභාවය අවශ්‍යය, ඉඳුම් හිටුම් හෙවත් නිවාස අවශ්‍යය, ඇඳුම් පැළඳුම් අවශ්‍යය, දරුවන්ට හොඳ අධ්‍යාපනයක් අවශ්‍යය, ඔවුන් වැඩිහිටි වු පසු හොඳ ජීවන මාර්ග අවශ්‍ය ය. මේ සඳහා අවශ්‍ය පරිදි පස, පොළොව, ජලය හා පරිසරය හැඩගස්වාගැනීම අවශ්‍යය, ගෞරවයෙන් සලකනු ලැබීම අවශ්‍යය, තෘප්තිමත් ජීවිතයක් අවශ්‍ය ය. මේ සියල්ල සඳහා මනා ගමනාගමන පහසුකම්, සන්නිවේදන පහසුකම්, තොරතුරු දැනගැනීමේ අයිතිය, යහපත් ජනමාධ්‍ය ආදිය තිබිය යුතු ය. එනම් ''නිදහස'' තිබිය යුතුය, මනා ජාත්‍යන්තර සබඳතා අවශ්‍යය, අපරාධ හා දූෂන වලින් තොර විය යුතු ය. මේ සියල්ල පවතින පාලනය ලවා ඉටුකරවා ගැනීමටත්, තමන් විසින්ම කළයුතු දේ හා කළහැකි දේ විධිමත්ව කිරීමටත් මහජනතාව සමත් විය යුතු ය. ජනවාර්ගික කණ්ඩායම් අතර, විවිධ ආගමික පිරිස් අතර, සාධාරණත්වය හා සාමය පැවතිය යුතු ය. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා සාධාරණය තිබිය යුතු ය.

මේ සියලු කරුණු පාලනයකින්, උපරිම ලෙස ඉටුකරවාගැනීම සඳහා ඒවා ප්‍රතිපත්ති ලෙස හැඩගැස්විය යුතු ය. එම ප්‍රතිපත්ති සැලසුම් බවට පත් කරගත යුතු ය. එම ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය මහජනතාව විසින්ම කළ යුතු ය. එම ප්‍රතිපත්ති බලය ඉල්ලා සිටින්නන් වෙත ඉදිරිපත්

කිරීමටත්, බලය ඉල්ලා සිටින පක්ෂවල ප්‍රතිපත්ති හා ප්‍රතිපත්ති ප්‍රකාශන තුළට ඒවා ඇතුළත් කරගැනීමටත්, ඒවා පිළිබඳ පොරොන්දු ලබාගැනීමටත් ක්‍රම සකසා ගත යුතු ය. ඒවා ඉටුකරවා ගැනීමට සංවිධානගත වීම මහජනතාව විසින් කළ යුතු ය. දැනට සිදුවන්නේ බලය ඉල්ලා සිටින දේශපාලන පක්ෂ විසින් ඉහත කී මහජන ඉල්ලීම් සපුරා දෙන බවට පොරොන්දු දීම එක්තරා දුරකට කිරීමයි. එය ද අද එතරම් දුරට සිදු නොවේ. බලය ලබාගත් පසුව ඒවා ඉටුකරන බවට විශ්වාසය තැබිය හැකි කිසිඳු සැලැස්මක් බොහෝ දේශපාලන පක්ෂවලට නොමැත. එසේ තිබුනත් ඒවා ව්‍යාජ සැලසුම් මිස අවංකව ඉටුකරණ සැලසුම් නොවේ. සැලසුම් කිරීම මහජනතාවට අයිති කාර්යයක් ලෙස නොසැලකෙන තරම් ය. මේ තත්ත්වය හේතුවෙන් ආණ්ඩුවක් බලයට පත්වූ පසුව ක්‍රියාත්මක කළයුතු සැලසුම් සකස් කෙරෙන්නේ වෙනත් බලවේගයන් විසිනි.

## සැලසුම් හදන වෙනත් බලවේගයන්

බොහෝදුරට ආණ්ඩුවල සැලසුම් හැදෙන්නේ එක්කෝ ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ණය දෙන රටවල් හා ඔවුන්ගේ නියෝජිතයින් ලෙස කටයුතු කරන මහ බැංකුව, මහ භාණ්ඩාගාරය, අමාත්‍යාංශවල ස්ථිර ලේකම්වරු ආදී ඉහත කී මූල්‍ය ආයතනවල හෙංචයියලා අතිනි. නැතිනම් බොහෝවිට පෞද්ගලික අංශයේ මූලිකයින් වන ව්‍යාපාරික ප්‍රජාව අතිනි. ආණ්ඩුව ණයගැති වී සිටින නිසාත්, එම ණය නැවත නැවතත් ලබාගැනීමෙන් තොරව අයවැය පියවිය නොහැකි නිසාත් මෙය වැලැක්විය නොහැකි තත්ත්වයක් යැයි ඇතැම් අය කියති. එහෙත් මේ ණයගැතිභාවය අඩුකර ගැනීම සඳහා හෝ ණයෙන් නිදහස් වීම සඳහාත්, ජනතාවගේ ස්වෛරීභාවය පාවිච්චි කිරීම සඳහාත් කිසිදු උත්සහයක් දරණු නොපෙනේ. එබැවින් ණය එන්න, එන්නම වැඩි වේ. වැඩියෙන් ණය ගැනීමට කිසිදු පැකිලීමක් නැත. ඊට හේතුව ණයගන්නේ එක් පිරිසකි. ඒ බලය දරා සිටින පිරිසයි. ණය ආපසු ගෙවීමේ බරදරන්නේ තවත් පිරිසකි. ඒ සාමාන්‍ය රටවැසියායි. ණයගන්නා අයට මෙය වාසිදායක ය. ඒ, එසේ ලබාගන්නා මුදල් වලින් විශාල කොමිස් ලබාගැනීමට ඔවුනට හැකි නිසා ය. ණය දෙන අයට ද එය වාසිදායක ය, ඒ ඔවුනට උවමනා දේ එම ණය මුදල් වලින් නිමකරවා ගැනීමට හැකි නිසා ය. මේ ණය ගැනීම

අවාසිදායක වන්නේ සාමාන්‍ය මහජනතාවට ය. ඒ, එම ණය ගෙවීමේ බර ඔවුන් මත පැටවෙන නිසා ය. ඒ සියල්ල නිසා ආහාර ජනතාවට ලබාගත නොහැකි තරම් මිල ඉහළ යයි. සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස, ගමනාගමනය, ඩීසල්, පැට්‍රල්, විදුලිය, දුරකතන මේ ආදී සියල්ල ඉහළ යයි. ණය දෙන්නෝ අයවැය පරතරය අඩුකරන ලෙස කියති. එහෙත් අයවැය පරතරය විශාල කෙරෙන වැය වැඩි කිරීම ගැන ඔවුන්ගේ අකමැත්තක් නැත. අය වැඩි කරගැනීම සඳහා දුප්පතුන් මත බදු බර වැඩිකරන ලෙස ඔවුහු උපදෙස් දෙති. ණය ගැනීම සඳහා එම උපදෙස් පිළිපැදිය යුතු හෙයින් ඒවා ණය කොන්දේසි හා නියෝග බවට පත්වේ.

**මෙබඳු තත්ත්වයක් තුළ මහජනතාව පාලනය බාරගත යුතු නැත.**

අද පවතින මෙම තත්ත්වය තුළ පාලනය බාරගන්නා කුමන හෝ පක්ෂයකට මේ සියල්ලට අවනත වීමට සිදුවේ. නොඑසේ නම් අවනත නොවීමට ජනතාව සංවිධානය කළ යුතු වේ. අද නිවැරදි දේශපාලන පක්ෂයක් විසින් කළයුත්තේ එසේ අවනත නොවීමට ජනතාව සංවිධාන ගත කිරීමයි. ඒ සඳහා පාලනය බාරගත යුතුම නැත ඇත්තෙන්ම පාලනය බාරගැනීම විශාල බාධකයකි.

**දේශපාලන ඉතිහාසයේ අත්දැකීම්**

ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය දෙස බලන කළ පාලනය බාර නොගත් පාලනයට හවුල් නොවු දේශපාලන පක්ෂ විසින් දිනාගත් මහජන ඉල්ලීම් බොහෝ ය. ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය බිහිවුයේ 1930 ගණන් වලදී ය. එකළ ඔවුනට රටේ පාලනය ලබාගැනීමේ හෝ පාලනයට හවුල් වීමේ අදහසක් නොතිබුනි. එදා ඒවා විප්ලවවාදී පක්ෂ වූහ. ඔවුන් විශ්වාස කළේ පංති අරගලය කෙරෙහි ය. ඔවුන්ගේ කාර්යය වුයේ පංති අරගලය සඳහා ජනතාව සංවිධානගත කිරීම ය.

රටට පූර්ණ නිදහස ලබාගැනීම සඳහා සංවිධානය වීමට ඔවුහු ජනතාව පෙළඹවූහ. සර්වජන ඡන්ද බලය ශ්‍රී ලංකාවට ලැබුනේ 1931 දීය. සර්වජන ඡන්ද බලය ලැබු ලෝකයේ ප්‍රථම රට වුයේ ශ්‍රී ලංකාව ය. එය ඉහත කී වාමාංශික දේශපාලන පක්ෂවල උද්ඝෝෂණයක් විය. ආහාර සහනාධාර ක්‍රමය ඔවුන්ගේ උද්ඝෝෂණ නිසා ලැබුනකි. නිදහස්

අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය ඔවුන්ගේ උද්ඝෝෂණ නිසා ලැබුන ඒවා ය. ඔවුහු මහජනතාව සංවිධානය කොට එම ඉල්ලීම් සඳහා සටන් කළහ. බලය ලබාගැනීමට කැමති වූ එ.ජා.ප වැනි පක්ෂ එම ඉල්ලීම් ලබාදෙන බවට පොරොන්දු වූහ. ඒ පොරොන්දු ඉටුකිරීමට ඔවුන්ට සිදුවුයේ එසේ නොකළහොත් ඒ ගැන සටන් කිරීමට ජනතාව සංවිධානය කොට තිබූ හෙයිනි. එදා පාලකයෝ හාල් සේරුව (කිලෝව) සත 25 ගණනේ දුන්හ. පාසැල් සිසුනට දිවා ආහාර සඳහා බනිස් ගෙඩියක් දුන්හ. ඕනෑම රෝගයක් සඳහා රජයේ රෝහල්වල ප්‍රතිකාර ලබාගත හැකි විය. නේවාසික පහසුකම් සහිත මෙම රෝහල්වල ඖෂධ, වෛද්‍ය උපදෙස්, ශල්‍යකර්ම ආදිය නොමිලයේ කරන ලදී. ප්‍රථම වර්ශයේ සිට විශ්වවිද්‍යාල දක්වා අධ්‍යාපනය නොමිලයේ ලැබුනි. මේ සියල්ල කරන ලද්දේ වාමාංශික පක්ෂ විසින් ජනතාව සංවිධානය කළ හෙයිනි. වාමාංශික පක්ෂ විසින් කම්කරු ජනතාව වෘත්තීය සමිති තුළ සංවිධානය කරන ලදී. එම වෘත්තීය සමිති විසින් බොහෝ කම්කරු ඉල්ලීම් දිනාගනු ලැබීය. පැය 8 ක වැඩ දිනයක්, ශ්‍රේණිගත වැටුප් ක්‍රමයක්, අතිකාල දීමනා, රැකියාවෙහි සුරක්ෂිත තාවය, කම්කරු අධිකරණ මෙසේ දිනාගත් ඉල්ලීම් විය. ජීවන වියදම වැඩිවීමට එරෙහිව ඔවුහු සටන් කළහ. ජීවන වියදම වැඩිවන විට වැඩි පඩි ඉල්ලා සටන් කළහ. නිදහස් මැතිවරණ ක්‍රමයක් සඳහා සටන් කළහ. රාජ්‍ය භාෂාව ඉංග්‍රිසියේ සිට සිංහල හා දෙමළ දක්වා මාරුකරන ලෙස ඔවුහු සටන් කළහ. එය ජනවාර්ගික සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා කළ සටනක් විය. මේ බොහෝ සටන් ජනතාව විසින් ජයගනු ලැබුවේ එදා වාමාංශික පක්ෂ ජනතාව අරගලය සඳහා සංවිධානය කිරීම කෙරෙහි ප්‍රමුඛතාවය දුන් නිසා ය. සිංහල හා දෙමළ රාජ්‍ය භාෂා බවට පත්කරගැනීම සඳහා සටන ජයගත නොහැකි විය. එහි ප්‍රතිඵලය බිහිසුණු විය.

## බලයට හවුල් නොවී සටන් කොට දිනාගත් දේ

ජනපද ක්‍රමය පිහිටුවා තෙත් කළාපයේ හා සබරගමුව වැනි පළාත්වල ඉඩම් හිඟ ප්‍රදේශවල ජනතාව පදිංචි කරවා වියලි කලාපීය ගොවි ජනපදවල ඉඩම් හා ජලය ලබාදුන්නේ, එම ප්‍රදේශවල ඉඩම් අහිමි ජනතාව වමේ පක්ෂවල මෙහෙයවීම යටතේ කම්කරු ව්‍යාපාරය සමග එකතු වීමේ බියක් හා අනතුරක් ඇති බව ඩී. එස්.සේනානායක වැනි

දක්ෂිණාංශික නායකයෝ දුටු නිසා ය. ගොවි ජනතාවට සහනදායි වන පියවර ගණනාවක් මෙලෙස දිනාගැනීමට ද හැකි විය.

ඉඩම් නැති අයට ඉඩම් ලබාගැනීම, වාරිමාර්ග පහසුකම් ලබාගැනීම, නිවාස හා ගොවි උපකරණ සඳහා සහනාධාර ලබාගැනීම, අඩු මිලට අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබාගැනීම, තම නිෂ්පාදන (වී) අලෙවිය සඳහා සහතික මිල ක්‍රමයක් සහිතව වී අලෙවි මණ්ඩලය පිහිටුවීම, අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව හා මාක්ෆෙඩ් ආයතනය, ධීවර සංස්ථාව, ජාතික කිරි මණ්ඩලය ආදිය පිහිටුවීම මේ අතර විය. මේ සියලු අයිතීන් හා සහන දිනාගත හැකිවුයේ ජනතාව සංවිධානය වී සටන් කිරීම තුළින් විය. මීට අමතරව වතු ජනසතු කරන ලදී. 1972 හා 1975 ඉඩම් ප්‍රතිසංස්කරණ 1971 තරුණ නැගිටීම නිසා සිදු කෙරිණ. ලංකා ගමනාගමන මණ්ඩලයේ පිහිටුවා පෞද්ගලික බස් කොම්පැණි වෙනුවට රජයේ ප්‍රවාහන සේවායක් පිහිටුවීම, දුම්රිය සේවය රජය යටතේ පවත්වාගෙන යාම විය. මේ සියලු ආයතන හා වැඩපිළිවෙළ අරමුණ වුයේ ජනතාවගේ මූලික අවශ්‍යතා ඔවුනට දැරිය හැකි මිලට ලබාදීමයි. රටේ ආහාර සුරක්ෂිතතාවය, ළදරුවන් හා මවුවරුන්ගේ නිසි පෝෂණය, නිරෝගීභාවය මෙසේ සපුරා ගත හැකිවිය.

මේ සියල්ල දිනාගන්නා තුරු,විප්ලවාදී දේශපාලන දර්ශනයන් මත පිහිටි වාමාංශික පක්ෂ කියා සිටියේ තමන් පාර්ලිමේන්තු දේශපාලන බලය ලබාගැනීමට ඉලක්ක නොකරන බවත් පාර්ලිමේන්තු මැතිවරණ හුදෙක් තම දේශපාලන වේදිකාවක් ලෙස යොදාගනු ලබන බවත් ය. මේ අනුව ඔවුහු මැතිවරණ වල දී පරාජයට ලක් වු නමුත් ජනතාවට විශාල සහන හා අයිතිවාසිකම් දිනාදීමට දායක වුහ.

## ධනපති දේශපාලන පක්ෂ සමග හවුල් වීම හා ප්‍රතිසංස්කරණවාදී දේශපාලනයට මාරුවීම

ඉහත කී පංති අරගලයට මුල්තැන දුන් දේශපාලනයෙන් මාරුවීමට මෙම පක්ෂවලට බලපෑ හේතු කීපයක් විය. ඉන් ප්‍රධාන එකක් වුයේ එස්. ඩබ්. ආර්. ඩී.බණ්ඩාරනායක මහතා එ.ජා.ප යෙන් ඉවත්ව ශ්‍රී.ල.නි.ප පිහිටුවා ගැනීමයි. ඔහු මැද පිළිවෙතක් අනුගමනය කරන බව ප්‍රකාශ කළ අතර සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගයේ ශක්තිය

මත ජයග්‍රහණය කිරීම අරමුණු කොටගත්තේ ය. මේ අතර ගොවි, කම්කරු, යන බලවේගයන් වාමාංශික පක්ෂ විසින් සංවිධානය කිරීමට උත්සහ කළ බලවේගයන් වුහ. බණ්ඩාරනායක මැදුම් පිළිවෙත වුයේ ගොවි, කම්කරු බලවේගයන් ද දිනාගත හැකි ඇතැම් ප්‍රතිපත්ති තම දේශපාලනයට ඇතුලත් කරගැනීමයි.

එබැවින් ඉන් පසුව ඇති වු මැතිවරණවල දී වමේ පක්ෂවලට ප්‍රශ්නයක් ඇති විය. එනම් එ.ජා.ප හා ශ්‍රී.ල.නි.ප යන පක්ෂ දෙකම ධනපති පක්ෂ ලෙස සලකා, ඒ දෙකටම එරෙහිව ස්වාධීනව සටන් කරනවාද? නොඑසේ නම් මේ දෙක අතරින් වඩාත් දක්ෂිණාංශික පක්ෂය ලෙස පෙනුනු එ.ජා.ප ය පරාජය කිරීම සඳහා ශ්‍රී.ල.නි.ප යට සහයෝගය දීම කරනවාද? නිතරඟ ගිවිසුම් ඇතිකර ගන්නවා ද යන්නයි. මෙහිදී 1956 මැතිවරණයේ දී එබඳු නිතරඟ ගිවිසුමක් ඇති කරගත් අතර එය ශ්‍රී.ල.නි.ප යේ විශාල ජයග්‍රහණයකට හේතු විය. ශ්‍රී.ල.නි.ප යේ ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට වමේ පක්ෂ මෙසේ හවුල් වු නමුදු බණ්ඩාරනායක පාලන සමයේ දී වමේ පක්ෂ විසින් ජනතා ඉල්ලීම් මුල් කරගෙන විශාල සටන් මෙහෙයවනු ලැබීය. මෙය ශ්‍රී.ල.නි.ප ය ලවා වැදගත් ප්‍රතිසංස්කරණයන් රාශියක් කරවා ගැනීමට සමත් විය. 1960 මැතිවරණයේ දී වමේ පක්ෂ යලිත් වෙනම තරග වැදුණු අතර, එය එ.ජා.ප යේ ජයග්‍රහණයට හේතු විය. මේ නිසා 1965 මැතිවරණයේ දී යලිත් එක්සත් පෙරමුණක් ගොඩනඟා ගැනීමට ඔවුන් පෙළඹුනහ. පිලිප් ගුණවර්ධන වාමාංශික එක්සත් පෙරමුණ බිඳ දමා ශ්‍රී.ල.නි.ප සමග එක්ව මහජන එක්සත් පෙරමුණ ගොඩනගන ලදී. එහි අමාත්‍යධුරයක් එතුමා විසින් බාරගන්නා ලදී. මෙය පසුව ල.ස.ස.ප හා කො.ප යද සිරිමාවෝ බණ්ඩාරනායක සමග එක්ව එක්සත් පෙරමුණක් ගොඩනඟා ගැනීමට පෙළඹවු හේතුවක් විය. එයින් පසුව පිහිටවනු ලැබු එක්සත් පෙරමුණු ආණ්ඩුවේ මුදල් ඇමතිධුරය ආචාර්ය එන්. එම්.පෙරේරා විසින් ද, තවත් අමාත්‍යාංශ ගණනාවක් වාමාංශික නියෝජිතයින් විසින් ද බාරගන්නා ලදී.

1970 දී එම එක්සත් පෙරමුණ විශාල මැතිවරණ ජයග්‍රහණයක් ලබාගන්නා ලද අතර, එම ආණ්ඩුවේ ප්‍රතිපත්ති වලට වමේ පක්ෂ විසින් යෝජනා කළ ප්‍රතිපත්ති රාශියක් ද ඇතුල් කරගන්නා ලදී.

මෙම වකවානුව තුළ සෝවියට් දේශය විසින් යෝජනා කරන ලද උපායමාර්ගය වුයේ සාමකාමී පරිවර්තනයක් පිළිබඳ ප්‍රතිපත්තියයි. ඔවුන් කියා සිටියේ ඇතැම් මැදපිළිවෙත පිළිගන්නා දක්ෂිණාංශික ආණ්ඩු සමග හවුල් වී, ඔවුන් සාමකාමී පරිවර්තනයක් කරා යොමුකරවීම තුළින් සමාජවාදය කරා සාමකාමීව පරිවර්තනය විය හැකි බවයි. මෙබඳු පිළිවෙතක් අනුගමනය කරන ආණ්ඩුවලට සෝවියට් දේශයේ ද, සෙසු නැගෙනහිර යුරෝපීය සමාජවාදී රටවල ද විශාල සහයෝගයක් ලැබුණි.

මෙහිදී වැදගත් වන කරුණක් නම් වමේ පක්ෂ තම පංති සටන් මාවත වෙනුවට පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණවාදී මාවතක් කරා මාරුවීම ය.මෙසේ හවුල් වී අමාත්‍යධුර බාරගැනීම නිසා ආචාර්ය ඇන්. ඇම්.පෙරේරා වැනි අයට විශාල විවේචනයට ලක් වු ඇතැම් දෑ කරන්නට සිදුවිය. එනම් වාමාංශික එක්සත් පෙරමුණ ගොඩනගා ගැනීමේ දී ඉදිරිපත් කළ කම්කරු ව්‍යාපාරයේ ඉල්ලීම් 21 සඳහා සටන පාවාදීම පිළිබඳ චෝදනාවයි. එය සත්‍යයකි. 1970 ආණ්ඩුව පිහිටුවා අමාත්‍යධුර බාරගැනීමේ දී ඇන්. ඇම්.පෙරේරා වැනි අයගේ මතය වුයේ 1970 වේ. හවුල් ආණ්ඩුවට ලංකාවේ ධනපති පංතිය දුර්වල කරනු සඳහා වන පියවර රාශියක් ගත හැකිව තිබු බවයි.

එහෙත්, ඒ බලාපොරොත්තු රාශියක් ඉටු කරගැනීමට එක් බාධකයක් වුයේ 1971 දී ජනතා විමුක්ති පෙරමුණ විසින් දියත් කළ සන්නද්ධ අරගලයයි. එම ආණ්ඩුවේ හවුල්කරුවන්ව සිටි ල.ස.ස.ප හා කො.ප.ය ද එම මර්දනයට හවුල්කරුවෝ වුහ. මේ හේතුව නිසා ඊට පසුව 1977 දී පැවති මැතිවරණයේ දී ශ්‍රී.ල.නි.ප යට විශාල පරාජයක් ලැබුණු අතර ල.ස.ස.ප හා කො.ප යට එක දු ආසනයක්වත් දිනාගැනීමට නොහැකි විය. එ.ජා.ප යට තනි පක්ෂයක් වශයෙන් 4/5 ක බහුතරයක් ලබාගත හැකි විය.

**1977 එ.ජා.ප යේ ජයග්‍රහණය හා එයින් ඇති වු විශාල වෙනස**

තනි පක්ෂයක් ලෙස එ.ජා.ප ය ලැබු 4/5 ක බහුතරය විශාල පරිවර්තනයක් රටේ සමස්ත ආර්ථික ප්‍රතිපත්ති තුළ සිදුකිරීමට යොදාගන්නා ලදී. මෙම ජයග්‍රහණය ජේ. ආර්.ජයවර්ධන විසින් රට තුළ හා එහි ආර්ථික ප්‍රතිපත්ති තුළ අතිවිශාල පරිවර්තනයක් සඳහා

යොදාගන්නා ලදී. 1978 දී ඔහු නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගන්නා ලදී. සියලු විධායක බලතල සහිත ජනාධිපතිධුරයක් පිහිටුවන ලදී. ඔහු ජනාධිපති විය. ඔහුට උවමනා වුයේ රටේ ආර්ථික පිළිවෙත මුළුමනින්ම වෙනතකට හැරවීමයි. එම ආර්ථික පිළිවෙත අපි ''විවෘත ආර්ථික ප්‍රතිපත්තිය'' ලෙස හැඳින්වීමට පුරුදු වී සිටිමු. එහි දර්ශනය වුයේ ශ්‍රී ලංකාව කර්මාන්ත හෝ කෘෂිකර්මය අතින් ස්වයංපෝෂිත කිරීම නොව හැකිතරම් අපනයන වැඩිකොට ආර්ථිකයේ වර්ධන වේගය ඉහළ දැමීම ය. එම ආර්ථික වර්ධනය පහළට කාන්දු වීම (Trickle down) තුළින් දුප්පත්කම අඩු කළ හැකිවනු ඇතැයි කියන ලදී. එහෙත් මේ අපනයන වැඩිකරන ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය දෑ අප රට තුළ නොවින.

එනම් ප්‍රාග්ධනය නොමැති වීම, තාක්ෂණය අඩු දියුණු වීම හා ජාත්‍යන්තර වෙළෙඳපොළට ඇතුළුව තරග කිරීමේ හැකියාව අඩුවීම ය.

මේ කොන්දේසී සපුරාලනු පිණිස විදේශ ආයෝජකයින් රට තුළට ගෙන්වා ගැනීම ඔහුගේ අපේක්ෂාව විය. එම ආයෝජකයින් ඉල්ලා සිටි වාසිදායක තත්වයන් ලබාදීමට සිදුවිය. ''කොල්ලකාර සාමිවරුන් ආවාවේ'' යයි ජේ. ආර් මෙය විස්තර කළේ ය.

### අ) දේශපාලන ස්ථාවරභාවය

මේ සඳහා විධායක බලතල සියල්ල එක් පුද්ගලයෙකු සතු කරන විධායක ජනාධිපති ධුරය පිහිටු වින. ශක්තිමත් වෘත්තීය සමිති සංවිධාන ඇති රටකට ආයෝජකයෝ කැමති නැත. එබැවින් වෘත්තීය සමිති ව්‍යාපාරය මර්දනය කිරීම අවශ්‍ය විය. එය 1980 ජුලි මහ වැඩ වර්ජනය මැඩ පැවැත්වීමේ දී කරන ලදී. නිල රජයේ සංඛ්‍යා අනුව 40,000 ක් එක් රැයක දී රැකියා වලින් ඉවත් කරන ලදී. වෘත්තීය සමිති සංඛ්‍යා අනුව එය 100,000 කට වැඩි ගණනකි. ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ මර්දනය කිරීමත්, දේශපාලන පළිගැනීම් කිරීමත් මේ සමග සිදුවිය. විපක්ෂ නායිකාවගේ ප්‍රජා අයිතිය අහෝසි කෙරුණු අතර වසර 7 ක් ඇයට තරග කිරීම තහනම් කෙරිණ. මහ මැතිවරණය කල් දමන ලදී.

**ආ) ආනයන ලිහිල් කිරීම**

පිටරටින් ඕනෑ තරම් බඩු ගෙන්වීමට අවසර දෙන ලද අතර, ලංකාවේ කළ හැකිව තිබූ නිෂ්පාදනයන් වන සහල්, වෙනත් ආහාර ආදිය පවා ගෙනවීම දිරිගන්වන ලදී. ස්වයංපෝෂිතභාවය අවශ්‍ය නැතැයි කියැවින. පිටින් ලාබෙට ගෙන්විය හැකි බඩු ගෙන්වීමට ඉඩදෙන ලදී. මේ අනුව කාර්මික භාණ්ඩ පමණක් නොව කෘෂි නිෂ්පාදන ද පිටින් ගෙන්වන ලදී. දේශීය කර්මන්ත හා කෘෂිකර්මයට නිසි රැකවරණය නොලැබ ඒවා බිඳ වැටුනි.

**ඇ) පෞද්ගලික අංශයට ප්‍රමුඛ ස්ථානය දීම**

රටේ ආර්ථික වර්ධනයේ ''එන්ජිම'' ලෙස පෞද්ගලික අංශය සලකන බව ප්‍රකාශ කළ අතර, පෞද්ගලික අංශයට සියලු දිරිගැන්වීම් හා ආධාර දෙන ලදී. රාජ්‍ය අංශයට අයත්ව තිබූ කර්මාන්ත හා සේවාවන් පෞද්ගලික අංශයට පවරන ලදී. ඔවුනට විශාල බදු සහනයන් හා බදු විරාමයන් ලබාදෙන ලදී. වී අලෙවි මණ්ඩලය වසා දැමීම, ජාතික කිරි මණ්ඩලය වසා දැමීම, අලෙවි සංවර්ධන මණ්ඩලය හා මාර්ක්ෆෙඩ් ආයතනය දුබල කිරීම, මොනරාගල, මන්නාරම හා වවුනියාව යන දිස්ත්‍රික්ක ''කෘෂිකර්ම ප්‍රවර්ධන කලාප'' ලෙස නම් කොට, එම කලාප වලට එන ආයෝජකයින්ට නිදහස් වෙළෙඳ කලාපවලට සමාන බදු සහන හා විරාම ලබාදීම. ආනයනය හා අපනයනය පෞද්ගලික අංශයට විවෘත කිරීම, සියලු මිල පාලනයන් ඉවත් කිරීම. කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත සඳහා විදේශ ආයෝජකයින් කැඳවීම මේ අතර විය. මේ සියලු පියවරයන්ගෙන් සිදුවූයේ රටේ දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ට තිබූ සියලු රැකවරණ ඉවත් කිරීම ය. රටේ ආර්ථික මෙහෙය වීම සම්පූර්ණයෙන් පෞද්ගලික ව්‍යාපාරිකයින් වෙත පවරන ලදී.

**ඈ) යටිතල පහසුකම් දියුණු කිරීම**

විදේශ ආයෝජකයින් රට තුළට ගෙන්වා ගැනීම සඳහා ඔවුනට වෙනත් දියුණු රටවල දී ඇති යටිතල පහසුකම් වලට සමාන යටිතල පහසුකම් ලබාදීම අවශ්‍ය විය. මේ සඳහා මහ කොළඹ ප්‍රදේශය තුළ එම පහසුකම් දියුණු කිරීම අවශ්‍ය විය. කොළඹ වරාය විශාල කර නවීකරණය කරන

ලදී. කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල දියුණු කරන ලදී. කොළඹ නගරය වාණිජ අගනුවරක් ලෙස දියුණු කිරීම සඳහා පරිපාලන අගනුවර ''ශ්‍රී ජයවර්ධන පුර'' නමින් කෝට්ටේට ගෙනයන ලදී. පාර්ලිමේන්තු සංකීර්ණය ගොඩනැගීම ඉන් එකක් විය.

මෙ සියලු කටයුතු සඳහාත්, ආනයන ලිහිල් කිරීම සඳහාත් අතිවිශාල මුදලක් ණයට ගෙන වැය කරන ලදී. ඒ සියලු ණය බර සාමාන්‍ය ජනතාව මත පැටවින.

මේ සියලු කටයුතු නිසා දේශීය ආහාර නිෂ්පාදනය කඩා වැටුනි, බඩු මිල වැඩිවිය. බඩු මිල වැඩිවීමට තවත් විශාලතම හේතුවක් වුයේ රුපියල අවප්‍රමාණය කිරීම ය. 1977 දී ඇමරිකන් ඩොලරයක් රුපියල් 8 ක් වු අතර, ප්‍රථම අවප්‍රමාණය කිරීම නිසා එය රු.16 ක් විය. පසුව රුපියල පා කිරීම කරන ලද අතර, අද එය රුපියල් 130 දක්වා වැඩි වී තිබේ. මේ අනුව සියලු බඩුවල මිල වැඩිවිය. මෙයින් අපනයන වැඩිකිරීම බලාපොරොත්තු වු නමුදු ඊට වඩා වැඩියෙන් ආනයන වැඩිවිය.

මේ සියලු පියවර එලෙස පවත්වා ගෙන යාමත්, ඒවා තවදුරටත් ඉදිරියට ගෙනයාමත් අද බලයට පත්වන ආණ්ඩු එකඟවෙයි. තවදුරටත් මේ ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සඳහා ආණ්ඩු ලෝක බැංකු විසින් යෝජිත ''යළි පුබුදමු ශ්‍රී ලංකා'' උපායමාර්ගය පිළිගනිති. ඊට අදාලව රටපුරා අධිවේගී මාර්ග තැනීම, හම්බන්තොට වරාය හා මත්තල ගුවන් තොටුපොල හැදීම කර ඇත. තව අධිවේගී මාර්ග ගණනාවක් හැදීමට නියමිතය, සංචාරක කලාප හැදීමට නියමිත ය. පොලොන්නරුව - ත්‍රිකුණාමලය ඇතුලත් කලාපය ඇතුළු කලාප ගණනාවක් මහා නාගරික කලාප (Metropolitan Areas) ලෙස ගොඩනැගීම යෝජනා කොට ඇත. මේ සියලු යෝජනා හා සැලසුම් දෙස බලන කළ රට ගමන් කරනුයේ කුමන දිසාවකට ද යන්න පැහැදිලිව පෙනේ. ආර්ථික වර්ධන වේගය අපේක්ෂා කළ ලෙස ඉහළයාමක් සිදු වී නැත. එය කිසිසේත්ම පහළට කාන්දු වී දුප්පත්කම අඩුවීමක් ද සිදු වී නැත. එසේ සිදුවේයැයි බලාපොරොත්තු වීමට කිසිඳු සාධකයක් දැකිය නොහැකි ය. මේ අනුව දැනට ඇති ආණ්ඩුවලට හවුල්වීම හෝ ආණ්ඩු බලය ලබාගෙන මේ

කටයුතු එලෙස කරගෙනයාමට එකඟවීම හෝ කිසිදු ජනතාවාදී පක්ෂයක් විසින් නොකළ යුතු ය.

## නව වමේ (JVP) අත්දැකීම

අලුත් වාමාංශික ව්‍යාපාරය ලෙස ගොඩනැගුණු ජනතා විමුක්ති පෙරමුණේ අත්දැකීම් ද වැදගත් ය. පැරණි වමට ප්‍රතිපත්ති පාවාදීම පිළිබඳ චෝදනා කොට ගොඩනැගුණු ජනතා විමුක්ති පෙරමුණ ද, පසුකාලයේ දී පාර්ලිමේන්තුවෙන් බලය ලබාගැනීම අරමුණු කොටගත් පක්ෂයක් බවට පත්විය. එම පක්ෂයට මුල දී විශාල ජනප්‍රියතාවයක් ලැබුණි. මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට විශාල ජයග්‍රහණයක් අත්කරදීමට ජනතා විමුක්ති පෙරමුණේ හවුල්කාරීත්වය උපකාර විය. ''මහින්ද චින්තනය'' නමින් මුලින් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයට විශාල බලපෑමක් කිරීමට ජනතා විමුක්ති පෙරමුණට හැකිවිය. බලයේ සිටින ආණ්ඩුව සමග හවුල් වී ''පරිවාස ආණ්ඩුවක්'' හැදීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කරන ලදී. එය පැරණි වමේ පක්ෂ විසින් ගොඩනඟන ලද එක්සත් පෙරමුණු ආණ්ඩුවට විශාල වශයෙන් සමානවූවකි. ප්‍රතිඵලය වූයේ දක්ෂිනාංශික ආණ්ඩුවක් හැදීමට දායකවීමත්, එම ආණ්ඩුව පොරොන්දු වූ ප්‍රතිපත්ති පිටුදකිමින් කටයුතු කරද්දී එයින් ඉවත් වීමට සිදුවීමත් ය. නන්දන ගුණතිලක හා විමල් වීරවංශ වැනි ප්‍රමුඛයෝ කීපදෙනෙක් ආණ්ඩුව සමග ඉතිරි වූහ. ජ.වි.පෙ තිබූ ජනප්‍රියතාවය බිඳවැටුනි. දැන් ඔවුහු යළිත් ගොඩනැගීමට උත්සාහ කරමින් සිටිති.

## මේ සියලු කටයුතු වලින් උගත යුතු පාඩම කුමක්ද?

ප්‍රථමයෙන්ම වටහාගත යුතු කරුණු වන්නේ මේ කිසිදු මැතිවරණයක දී ඡන්ද දායක මහජනයා බලයට පත් නොවන බවයි. ඡන්දයෙන් පසුව ඔවුහු පරාජයට පත්වීම ආරම්භ වේ. අද බලයට පත්වන මන්ත්‍රීවරු කවුරුත් කරන්නේ තම ඡන්ද දායකයින්ගේ ඉල්ලීම් හා අවශ්‍යතා වෙනුවෙන් සටන් කිරීම නොවේ. ලබාගත් බලයෙන් හැකිතරම් පෞද්ගලික ප්‍රයෝජන ලබාගැනීමයි. ඒ සඳහා සුදුසුම ක්‍රියාමාර්ගය වන්නේ විපක්ෂයේ සිටීමට වඩා පිල්මාරු කර බලයේ සිටින පක්ෂයට යාම ය. හැකිනම් ඒ සඳහා අමාත්‍යධුරයක් හෝ විශාල මුදලක් ලබාගැනීම කරති. එබැවින්

මහජනයා නියෝජනය කරන්නෙක් නැත. ජාත්‍යන්තර ධනපතීන් හා දේශීය ව්‍යාපාරික ප්‍රජාවට තම උවමනාවන් රජය ලවා ඉටු කරවා ගැනීමේ යම් හැකියාවක් ඇත. මේ ආණ්ඩු ධනපති ආණ්ඩුවන්නේ එබැවිනි. වමේ පක්ෂ වලට අද තම ප්‍රතිපත්ති අනුව තමන්ගේම ආණ්ඩු පිහිටුවා ගත නොහැක. එබැවින් ඔවුහුද  තම ප්‍රතිපත්ති ධනපති පංතියට ගැළපෙන ලෙස සංශෝධනය කර ගනිති. එසේ හවුල් නොවුවහොත් ආසනයක්වත් දිනාගැනීම අපහසු ය. එබැවින් මහජනතාවගේ පක්ෂ විය යුත්තේ මේ ක්‍රමය තුළ ආණ්ඩු බලය ඉල්ලා නොසිටින පක්ෂ බවට පත්වීමකි.

**ආණ්ඩු බලය ඉල්ලා නොසිටින්නේ නම් එම පක්ෂ කළ යුත්තේ කුමක්ද?**

මහජනතාවට හැමදාම කිරීමට සිදුවන කාර්යයක් ඇත. ඒ තමන්ට එරෙහිවන පියවර ගැනීමෙන් ආණ්ඩු වලක්වා ගැනීමත්, තමන්ට අවශ්‍ය ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළවල්  පිළිගැනීමටත්, ඒවා ක්‍රියාවට නැගීමටත් සටන් කිරීම ය. මෙය කිරීම සඳහා මහජනතාව සූදානම් කිරීමක් අවශ්‍ය ය. එහි කාර්යයන් කීපයක් ඇත.

01. ආණ්ඩු විසින් ක්‍රියාත්මක කරන සැලසුම් හා ඒවායේ අරමුණු තේරුම් ගැනීම. ඉහත විස්තර කළේ තරමක් දුරට ඒ ආණ්ඩුවල සැලසුම් හා ඒවායේ අරමුණු සමහරෙකි.

**දේශපාලන විග්‍රහයක්**

මේවා තේරුම්ගැනීම සඳහා මහජනතාවට ගැඹුරු දේශපාලන විග්‍රහයන් කරගැනීම අවශ්‍ය වේ. මහජන දේශපාලනය කරන පක්ෂ විසින් මෙම දේශපාලන විග්‍රහයන් කරගැනීමට මහජනතාව හුරුකළ යුතු ය. පුහුණු කළ යුතු ය. පැරණි වමේ පක්ෂ විසින් මුල් කාලයේ දී මෙම කටයුත්ත මනාව කරන ලදී. ඔවුහු තම පක්ෂ හරහා නව සාමාජිකයින් සමග එම විග්‍රහයන් කළහ. ඔවුහු ඒවා මහජනතාව අතරට ගෙනගියහ. ඒ අනුව එම පියවරයන් සම්බන්ධව තමන් ගත යුතු ස්ථාවරයන් මොනවාද? යන්න තීරණය කිරීමට මහජනතාවට හැකියාව ලැබේ. මෙය ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භයයි.

නිදසුනක් වශයෙන්,

1. ලංකාවේ ජනාධිපති ක්‍රමයක් ඇති කළේ ඇයි? සියලු විධායක බලතල තනි පුද්ගලයෙකු අතට ගන්නේ ඇයි?

2. පෞද්ගලික අංශයට රටේ ආර්ථිකය තුළ මෙතරම් බලයක් ලබා දී ඇත්තේ ඇයි?

3. රටේ ආනයනයන් ලිහිල් කර, දේශීය නිෂ්පාදනයන් කඩා වැටීමට සලස්වනු ලැබ ඇත්තේ ඇයි?

4. අධිවේගී මාර්ග, නගර සංවර්ධනය, ගුවන් තොටුපොළවල් හා වරායවල්, තාප බලාගාර ආදිය ගොඩනගන්නේ ඇයි? ඒවා සඳහා මෙතරම් විශාල ණයගන්නේ ඇයි? ජලය පෞද්ගලීකරණය කරන්නට උත්සහ කරන්නේ ඇයි?

5. ආර්ථික වර්ධනය වේගය වැඩි කොට, එය පහළට කාන්දු වීමට සැලැස්වීම මගින් දුප්පත්කම අඩු කළ හැකි ද? එය මෙතෙක් සිදුනොවුනේ ඇයි? යනාදී වශයෙනි.

මේ අනුව ඉහත කී සැලසුම් පිළිබඳව තමන් ගත යුතු ස්ථාවරයන් මොනවාද? යන්න තීරණය කිරීමට මහජනතාවට නිවැරදි අවබෝධයක් ලබාගත හැකිවිය යුතු ය. එම අහිතකර තීරණයන්ට එරෙහිවීම පමණක් නොව ඊට වෙනස්ව තමන් විසින් ක්‍රියාත්මක කළ හැකි හා යෝජනා කළ හැකි දේ මොනවාද? යන්න තීරණය කිරීම ද මහජනයා සතු වගකීමකි. අයිතියකි.

රට දියුණු කළ හැකි මාර්ගය විදේශ ආයෝජකයින් ගෙන්වා ගැනීම නොවන්නේ නම් ඒ සඳහා ගත යුතු මාවත කුමක්ද? මෙය තීරණය කළ යුත්තකි.

විදේශ ණය ලබාගැනීම සඳහා ඉහත කී දෑ කිරීමට සිදුවන්නේ නම්, ඒවා කිරීමෙන් යහපතක් නොවන්නේ නම් විදේශ ණය හා ආධාර නොමැතිව අපට කළ හැක්කේ කුමක්ද? ප්‍රාග්ධනය නොමැති රටක් සංවර්ධනය විය හැක්කේ කෙසේ ද? අප සතුව ඇති ප්‍රාග්ධනය කොපමණද? ඒ මොනවාද? යොදාගත හැකි වෙනත් සම්පත් මොනවාද? මේ පිළිබඳව

මහජනතාව සමග සංවාදයක් කිරීම සැබෑ මහජන දේශපාලන පක්ෂයක් වෙත පැවරෙන කාර්යයක් වේ.

**විකල්ප මාවත කුමක්ද?**

පැහැදිලි විකල්ප මාවතක් ගොඩනැගීම මහජන දේශපාලන පක්ෂයක අත්‍යවශ්‍ය කාර්යයක් වේ. මේ පිළිබඳව පසුගිය 37 වසර පුරා ගොඩනැගී ඇති අදහස් සම්පිණ්ඩනය කොට මහජනයා අතර සංවාදයකට ලක් කළ යුතු ය.

ඒ මෙසේ ය:

දුප්පත්කම තුරන් කරනු සඳහා ප්‍රාග්ධනය ණයට නොගෙන, වහා කළ හැකිදේ කුමක්ද? යන්නෙන් මෙය පටන් ගත හැකි ය. ප්‍රාග්ධනය ණයට නොගන්නේ නම් කළයුත්තේ සොබාදහමෙන් නොමිලයේ ලැබෙන දායදයන් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමයි. මේ සඳහා ප්‍රතිඋත්පාදන කෘෂිකර්මය උපයෝගී කොට ගත හැකිව තිබේ. පාරිසරික ගෙවතු කෘෂිකර්මය මේ සඳහා යොදාගත හැකි ප්‍රධාන මාර්ගයකි.

01. එහි දී පස රැකගැනීම, සෝදාපාළුව වැලැක්වීම.

02. හිරු එළියෙන් උපරිම ඵල ලැබීම සඳහා විවිධ ස්ථරයන්ට වැවෙන ගස් හැකි තරම් සිටුවීම.

03. සියලු කාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම හා වසුන් දැමීම.

04. හැකිතරම් ජෛව විවිධත්වය වැඩි කිරීම, බෝග විවිධත්වය වැඩි කිරීම, ආහාර විවිධත්වය හා පෝෂණය වැඩි කිරීම.

05. පසට ජලය උරාගැනීම හා රඳවාගැනීම වැඩි කිරීම.

06. වස විස සහිත බාහිර රසායනික යෙදවුම් භාවිතයෙන් වැලකීම හා මිශ්‍ර බෝග වගාවන්ගෙන් රෝග ව්‍යාප්ත වීම අඩුකර ගැනීම.

07. කෘෂි විවිධත්වය වැඩි කිරීම හා ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය වැඩි කිරීම. ජීවාමෘතය යොදාගැනීම (මේ සඳහා දේශීය ගවයින්ගේ ගොම සහ මුත්‍රා යොදාගැනීම) තුළින් පසේ සාරවත්භාවය දියුණු කිරීම.

08. රට මැද කඳුකරයේ භූමිය සංරක්ෂණය, ජෛව විවිධත්වය, ආහාර සුලභතාවය සඳහා කඳුකරයේ/වතුකරයේ ඉඩම් වතු ජනතාවට ප්‍රමුඛවත්, උඩරට ඉඩම් හිඟ ගැමි ජනතාව අතරත් බෙදාදීම.

09. වතුකරයේ, ගම්බද ප්‍රදේශවල, නගරවල හා ධීවර ප්‍රදේශවල තරුණ ජනයාට පාරිසරික කෘෂිකර්මය පිළිබඳ පුහුණුවක් ලබාදීම, ඒ පිළිබඳ උසස් අධ්‍යාපනයක් ලබාදීම තුලින් ඔවුන් පාරිසරික කෘෂි විද්‍යාඥයින් හා විශේෂඥයින් බවට පත්කිරීම.

10. බල ශක්තිය සඳහා හිරු එළිය යොදාගත හැකි හොඳම ක්‍රමය ලෙස ගස් සිටුවීම. ඩෙන්ඩ්‍රෝ බලය පාවිච්චි කිරීම, ඛනිජ ඉන්ධන භාවිතය හැකි තරම් අඩුකිරීම.

11. ධීවර කර්මාන්තය ප්‍රතිඋත්පාදනය සඳහා හැඩගැස්වීම හා ධීවර ජනතාවට මුහුදු බඩ හා වෙරළාසන්න ප්‍රදේශවල භූමිය ලබාදීම. සම්පත් සංරක්ෂණය සඳහා ක්‍රම යෙදීම (ප්‍රතිඋත්පාදනය).

12. පොල් වතු හා වෙනත් ඒක බෝග වගා වතු, කුඩා කැබලි ලෙස ගම්වාසීන්ට ලබාදීම තුළින් ඒවායේ පාරිසරික කෘෂිකර්මය නංවාලීම. ඌව පළාත වැනි සෙසු ප්‍රදේශවල පාරිසරික කෘෂිකර්මය දියුණු කරලීම.

## කර්මාන්ත හා සේවා ක්ෂේත්‍රවල ප්‍රතිඋත්පාදනය කෙසේ ගොඩනැඟිය හැකි ද?

අද කර්මාන්ත ක්ෂේත්‍රය යොමු වී ඇත්තේ ස්වභාවික සම්පත් හැකි තරම් වේගයෙන් උකහා ගන්නා හා උදුරාගන්නා ආකාරයටයි. මෙය වෙනස් කළ යුතු ය. හැකි තරම් අපතේ යැවීම කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රතිපත්තියකි. ඒ වෙළෙඳාම වැඩි කිරීම සඳහා අපතේ යැවීම අවශ්‍ය වන නිසා ය. අද වාහන, රූපවාහිනි යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර ආදිය නිපදවනු ලබන්නේ ඒවා දිගුකලක් පාවිච්චි කිරීම සඳහා නොව ඉක්මනින් යල්පැනගිය ඒවා

බවට පත්වන ආකාරයට ය. මෙය වෙනස් කළ යුතු ය. එයින් අමුද්‍රව්‍ය වඩා වැඩි ප්‍රමාණයක් පාවිච්චි කෙරෙන අතර, අපතේ දමන ඒවා නිසා පරිසරය අපවිත්‍ර වීම ද වැඩි වෙයි. තව ද ඛනිජ ඉන්ධන භාවිතය අඩුකිරීම ද අවශ්‍යව ඇත. ඛනිජ ඉන්ධන ක්ෂයවෙමින් ඇති නිසාත්, ඒවා දහනය වන තරමට වායුගෝලය උණුසුම් වීම වැඩි වන නිසාත් ය. මෙය වෙනස් නොකළහොත්, යළි අලුත් නොවන සම්පතක් වන නිසා ඛනිජ ඉන්ධන නිම වූ පසුව සියල්ල නතර වේ. බලශක්තිය සඳහා ඛනිජ ඉන්ධන නොවන මූලාශ්‍ර යොදාගත හැකි බව අපි කලින් පෙන්වා දුනිමු.

හැකිතරම් වැඩියෙන් කම්කරු ශ්‍රමය හැකි තරම් අඩු වැටුප් ගෙවා ලබාගැනීම ද කර්මාන්ත හා සේවා ක්ෂේත්‍රවල සාර්ථකත්වය සඳහා යොදාගන්නා ප්‍රතිපත්තියකි. මෙය වෙනස් කළ යුතු ය. ඒ සඳහා තම ශ්‍රමයේ නිසි වටිනාකම වැටුප් ලෙස ලබාගැනීම සඳහා ශ්‍රමිකයින් සංවිධාන කළ යුතු ය. අද ස්ත්‍රීන්ගේ ශ්‍රමය ලාභ ශ්‍රමය ලෙස යොදාගැනීම ශ්‍රී ලංකාව තුළ බහුලව සිදුවේ. මෙය වෙනස් කිරීම සඳහා වන සටන ස්ත්‍රීන් හා පිරිමින් විසින් කළ යුතු ය. මැදපෙරදිග ගෘහ සේවය, අපනයන ඇඟලුම් කම්හල්වල සේවය, ගොවිතැනේ ශ්‍රම ගෙවීම් ආදිය තුළ මෙය වැඩි වශයෙන් දැකිය හැකි ය. එය වෙනස් කිරීම සඳහා සැලසුම් සැකසීම ස්ත්‍රීන්ගේ නායකත්වයෙන් සිදුවිය යුතුය. ගමනාගමනය තුළ අතිවිශාල සම්පත් නාස්තියක් හා ඉන්ධන නාස්තියක් සිදුවේ. පාරවල්වලට ඔරොත්තු නොදෙන තරම් වාහන දුවති. මාර්ග අවහිර වීම් නිසා විශාල කාලයක් අපතේ යයි. පොදු මහජන ප්‍රවාහන සේවයන් දියුණු කොට පෞද්ගලික වාහන ප්‍රමාණය අඩු කළ හැකි ය. විදුලිය පරිහරණය ද, දුරකතන පරිහරණය ද විශාල අපතේ යැවීම සිදුවන ක්ෂේත්‍රයන් ය. මේවා අඩුකිරීම සඳහා ජනතාව සංවිධානය කිරීමත් නීති පැනවීමත් අවශ්‍ය ය. ගම් අතහැර නගරවලට සංක්‍රමණය වීම දිරිගැන්විය යුත්තක් නොවේ. නගරවල වියදම් අධික ය. පැල්පත් හා මුඩුක්කු ජනගහනය වැඩිවීම නිසා ප්‍රශ්න රාශියක් ඇති වේ. ගම්වල පහසුකම් දියුණු කළ යුතු ය. අවශ්‍ය නවීකරණයන් කළ යුතු ය. ජීවන මාර්ග සුලභ කළ යුතු ය. එවිට නගරවලට සංක්‍රමණයවීමේ කැමැත්ත හා අවශ්‍යතාවය අඩුවේ.

මෙම යෝජනා මගින් රටේ සංවර්ධනය, ප්‍රතිඋත්පාදනය, ණය බර අඩුකරගැනීම, සාගින්න හා මන්ද පෝෂණය තුරන් කිරීම, යහපත් ජීවන

මාර්ග බිහිකිරීම කළ හැකි වේ. වස විසෙන් තොර, ආහාර නිපදවන, පරිසරයක් ඇති, ලෙඩ රෝග අඩු දේශයක් ගොඩනැගිය හැක.

### අපේම දේශීය දාර්ශනික සම්පත්

මේ සඳහා අපේම දැනුම හා දාර්ශනික සම්පත් ලෙස බුදු දහම, දේශීය ආයුර්වේද වෙදකම හා දේශීය පාරම්පරික කෘෂිකර්මය යොදාගත හැක. අද රටේ පරිභෝජන රටාව හුරුකිරීම. කෘත්‍රිම ආහාර, වස විස ගොවිතැන ව්‍යාප්ත කරන බහුජාතික සමාගම්වල ප්‍රචාරක ව්‍යාපාරයන් පාලනය කළ යුතු ය. දේශීය බීජ සම්පත් රැකගැනීම හා ව්‍යාප්තිය කළ යුතු ය. දෙමුහුන් බීජ පාලනය කළ යුතු ය. ජාන වෙනස් කළ බීජ හා ආහාරවලට ඉඩ නොදිය යුතු ය.

### දේශපාලනික කාර්යය

බලය ඉල්ලා නොසිටින දේශපාලන ව්‍යාපාරයක් විසින් කළ යුත්තේ මෙබඳු යෝජනා මාලාවක් හා ඒ අනුව තම සැලසුම් සකසා ගැනීමක් කරා මහජනතාව මෙහෙයවීමයි. ඊට අවශ්‍ය අධ්‍යාපනය ගොඩනැගීමයි. අධ්‍යාපන ආයතන හා පාඨමාලා ඒ අනුව හැඩගැස්වීමයි. එය ජනතාව දේශපාලන සටන් කරා මෙහෙයවීමකි. පංති අරගල ඉදිරියට ගෙනයාමකි. ගෝලීයකරණ ධනවාදයේ බලපෑම්වලට අවනත නොවී ජනතාවගේ ස්වෛරීභාවය රැකගැනීම සඳහා සටන් කිරීමකි. මේ සඳහා රටේ අවශ්‍ය බලවේගයන් වන ගොවි, කම්කරු, ධීවර, වතු කම්කරු, ස්ත්‍රී, තරුණ හා ශිෂ්‍ය පිරිස් මෙහෙයවීම කළ යුතු ය. මෙබදු වැඩපිළිවෙළක් සඳහා රටේ විද්වතුන්, බුද්ධිමතුන්, ආගමික හා සමාජ නායකයින් යොමුකරවා ගැනීම අත්‍යවශ්‍ය ය.

අද ඇති දේශපාලන බල පොරයට ඇතුල්වීමට අකමැති බොහෝ උගතුන් සිටිති. තම දේශපාලන මත නිදහස්ව ප්‍රකාශ කිරීමට තහංචි පැන වී ඇති රාජ්‍ය නිලධාරින් සිටිති. ඔවුන්ට මෙබදු නිදහස් දේශපාලනයක දී තම මත ප්‍රකාශ කිරීම සඳහා ඉඩ ලබාගත හැකි ය. ලබා ගත යුතු ය.

### විද්‍යාඥයින් හා තාක්ෂණවේදීන්ගේ කාර්යය

මෙතෙක් විද්‍යාව හා තාක්ෂණය යොදාගනු ලැබුවේ හැකිතරම් උපරිම මට්ටමින් සොබාදහමේ සම්පත් උකහා ගැනීමට ය. එය වඩාත් වේගවත්ව, ආක්‍රමණශීලීව කිරීම ''දියුණුව'' ලෙස හා ඉදිරියට යාමක් ලෙස දකින ලදී. මෙය වැරදි බව අද ඔප්පු වී ඇත.එබැවින් විද්‍යාවේ හා තාක්ෂණයේ වත්මන් හා අනාගත කාර්යයන් වන්නේ සොබාදහමේ සම්පත් ප්‍රචණ්ඩ ලෙස උදුරාගැනීම මෙන්ම මෙතෙක් කළ ඒ උදුරාගැනීම නිසා සිදුවූ හානි හරිගැස්සීම සඳහා ක්‍රියාකිරීමයි. එබැවින් විද්‍යාව හා තාක්ෂණයේ කාර්යය විය යුත්තේ ''සොබාදහමේ ප්‍රතිඋත්පාදන ශක්තිය යළි ගොඩනඟා ගැනීම සඳහා දායකවීමයි.'' මේ පිළිබඳ පුළුල් සංවාදයක් රටේ ගොඩනැගීම නව දේශපාලනයේ කාර්ය භාරයකි. විශ්වවිද්‍යාල ඒ සඳහා යොමු කළ යුතු ය.

බුදුදහම ඇතුළු සෙසු ආගමික් ඉගැන්වීම්වල දර්ශනය වත්මන් සමාජ භාවිතය සඳහා යොදාගත යුතු ආකාරය සෙවිය යුතු ය. දේශීය ආයුර්වේදය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳව ඇති ඖෂධ ඥානය නිසි ගෞරවය සහිතව යොදාගත යුතු ය. ස්වභාවික ගොවිතැන් ක්‍රමය යළි ස්ථාපිත කළ යුතු ය. එහි ඥානයට නිසි ගරුත්වය සහිත පිළිගැනීමක් ලබාදිය යුතු ය. මේ පිළිබඳ විද්වතුන් හා පර්යේෂණ බිහිකළ යුතු ය.

### පහළ සිට ඉහළට සංවිධානගත කිරීම

මෙබදු සංවිධානගත කිරීමක් පහළ සිට ඉහළට ගොනැගිය යුතු ය. එනම් තම කුඩා ගෙවත්තෙහි හා ක්ෂුද්‍ර පරිසරය තුළ ප්‍රතිඋත්පාදන ගොවිතැන ගොඩනැගීම ඉහත කී මූලධර්මයන් මත කිරීම සියලු ජනතාවට, පවුල්වලට කළ හැක්කකි. එබඳු පවුල් එකතුව තම ප්‍රදේශය සඳහා, එනම් ගම, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ කිරීම එම ගමේ හෝ ප්‍රදේශයේ ජනතාව විසින් කළ යුත්තකි. කළ හැක්කකි. ඒ සඳහා තම ගෙවතුවල සැලසුම් එකතු කිරීමත්, එය තම ප්‍රජාවට අයත් ප්‍රදේශය දක්වා ව්‍යාප්ත කිරීමත් කළ යුතු ය.

මෙසේ සකස් කෙරෙන සැලසුම් ඉදිරිපත් කොට බලය ඉල්ලා සිටින අපේක්ෂකයින්ට ඒවා ඉටුකරන බවට පොරොන්දු ලබාගැනීමටත්, බලයට පත් වූ පසු ඒවා ඉටුකරන බවට වගවීම් ලබාගැනීමත් සඳහා ග්‍රාමීය ව්‍යුහයන් සිට ඉහළට දේශපාලන ව්‍යුහයන් ගොඩනැගිය යුතු ය. එම

ව්‍යුහයන් දේශපාලන බලය ඉල්ලා සිටින ව්‍යුහයන් නොව බලය ලබාගන්නා අය ලවා ඒවා ඉටුකරවා ගැනීම සඳහා වූ ව්‍යුහයන් ය.

දිවිනැගුම, ගමනැගුම, ගැමිදිරිය, මඟනැගුම, අපි වවමු රට නගමු හා සමෘද්ධිය වැනි ප්‍රකාශිත වැඩසටහන් දැනටමත් එබදු ප්‍රජා සැලසුම් මත ක්‍රියාකරන බවට පොරොන්දු දී ඇති ඒවා ය. එසේ ක්‍රියාකිරීම සඳහා වෙන්කර ඇති සම්පත් ඒ සඳහා යොදවා ගැනීමත්, එම ක්‍රියාකාරීත්වයන් අධීක්ෂණය කිරීමත් සඳහා මෙම සංවිධාන යෙදවිය යුතු ය.

මුල දී විස්තර කළ ජාතික මට්ටමේ සැලසුම්වල ඇති අහිතකර යෝජනා වලට විරුද්ධව සටන් කිරීම සඳහාත්, හිතකර සැලසුම් ක්‍රියාත්මක කරවා ගැනීම සඳහාත් වන දේශපාලන උද්ඝෝෂණ හා සටන් ව්‍යාපාරයන් දියත් කළ යුතු ය. බලය ඉල්ලා නොසිටින දේශපාලන ව්‍යාපාරයක කාර්ය වන්නේ එයයි.

**භූමියේ අයිතිය තිබිය යුත්තේ කාට ද?**

තවත් එක් වැදගත් මූලධර්මයක් ඇත. එනම් භූමියේ අයිතිය තිබිය යුත්තේ කාටද? යන්නයි. එය තිබිය යුත්තේ භූමිය සුවපත් කරන අයට හෙවත් එහි ප්‍රතිඋත්පාදන ශක්තිය යළි ගොඩනඟන අයට පමණි. ඒ අයිතිය ක්‍රියාත්මක කළ යුතු ය. මේ අනුව කඳුකර, වතුකරයේ භූමිය අයිති විය යුත්තේ එම භූමියෙහි වාසය කරන වතු ජනතාවට ය. ඒ ඔවුන් එම භූමිය යළිත් ප්‍රතිඋත්පාදනය සඳහා යොමුකරන්නේ නම් පමණි. ගොවි ප්‍රදේශවල භූමිය අයිති විය යුත්තේ ඒ ප්‍රදේශවල ගොවි ජනතාවට ය. ඒ ඔවුන් එම බිම්වල ප්‍රතිඋත්පාදනය යළි ගොඩනඟන්නන් වන නිසා ය. එසේ විය යුතු ය. උතුරු - නැගෙනහිර පළාත්වල භූමිය අයිති විය යුත්තේ ඒ ප්‍රදේශවල භූමිය මත ජීවත්වන ජනතාවට ය. ඒත් ඉහත කී මූලධර්මය මත භූමිය ප්‍රතිඋත්පාදනය කරන්නේ නම් පමණි. ධීවර ප්‍රදේශවල ද එය එසේ ය.

වත්මන් ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය එසේ සකස් වූවක් නොවේ. එය ඉඩම්වල පෞද්ගලික අයිතිය ලබාගැනීම සඳහා ඉංග්‍රිසි පාලකයින් විසින් ගෙනෙන ලද අසාධාරණ, අවිචාරාත්මක නීති නිසා ය. ඒ නීති පිළිපැදීමට අපි අද බැඳී සිටින්නෝ නොවෙමු. එසේ නොවිය යුතු ය. සොබාදහමින්

නොමිලයේ ලබාදෙන සම්පත් වලින් ගොවිතැන් කරන අයට, ඒවායින් අසාධාරණ ලාභ ඉපයීමක් කිරීමේ අයිතියක් නැත. උපදින දේ සියල්ලන් සඳහා ය. එය බෙදාහදාගත යුතු ය. මේ සඳහා දැනට ඇති සූරාකෑමේ වෙළෙඳාම් ක්‍රමය වෙනුවට නිෂ්පාදකයාත්, පාරිභෝගිකයාත් අතර සාධාරණ බෙදාගැනීම් ක්‍රමයක් හුවමාරු ක්‍රමයක් ගොඩනැගිය යුතු ය.

යම් දේශපාලන පක්ෂයක්, වත්මන් ක්‍රමය තුළ බලයට පත්වුව ද, ඉහත කී කිසිවක් කිරීමට එම බලයට ඉඩ නොලැබේ. ඉඩදෙනු ලබන්නේ ද නැත. එබැවින් ඒවා ඉටුකරවා ගත හැකිවන්නේ, ජනතාව දැනුම්වත් කොට, ඔවුන්ගේම සැලසුම් සකසා ගැනීමට යොමුකරවා, එම සැලසුම් ඉටුකරවා ගැනීමට සටන් කිරීමට සංවිධානය කිරීම තුළ පමණි. ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංගිය හැකි මාර්ගය වන්නේ ද එයයි.

මෙම පක්ෂය ගොඩනැගීම පහළ සිට ආරම්භ කළ යුතු ය. ඒ සඳහා අවබෝධය සහිත විද්වත් නායකත්වයක් ගොඩනඟාගැනීම පළමුවෙන් කළයුත්තකි. ඉහත කරුණු සම්බන්ධව විද්වතුන්, විi ාඥයින්, වෘත්තීය සමිති, ජනතා සංවිධාන, රජයේ නොවන සංවිධාන සමග සාකච්ඡා පවත්වා ප්‍රතිපත්තිමය එකඟතා ගොඩනඟා ගත යුතු ය. ආගමික නායකයින් ද ඊට ඇතුළත් කරගත හැක.

ඊළඟට කළයුත්තේ, ග්‍රාමීය ප්‍රජාවන්, ස්ත්‍රී සංවිධාන ආදිය සමග සාකච්ඡා කොට එකඟතා ගොඩනගා, ඔවුන් සංවිධානගත කිරීම ය. ඔවුන් මෙම සැලසුම් ක්‍රියාවට නැගීම ආරම්භ කළ යුතු ය. ඊළඟට එම සැලසුම් දිවිනැගුම, සමෘද්ධිය, ගැමිදිරිය වැනි වැඩසටහන් සඳහා ඉදිරිපත් කළ යුතු ය. ප්‍රාදේශීය සභා, පළාත් සභා ආදිය සඳහා ඡන්දය ඉල්ලන පක්ෂ හා අපේක්ෂකයින් වෙත ඒවා ඉදිරිපත් කළ යුතු ය. පොරොන්දු ලබාගත යුතු ය. එම පොරොන්දු ඉටුකරන බවට තම නියෝජිතයින්ට බල කරන, ඔවුන්ගෙන් උත්තර ලබාගන්නා සංවිධාන ව්‍යුහයන් ගොඩනැගිය යුතු ය. මෙලෙස ජාතික මට්ටමේ සැලසුම් හා වැඩ පිළිවෙළවල් ගැන සංවිධානාත්මක උද්ඝෝෂණ කළ යුතු ය. එවිට පාර්ලිමේන්තුවෙන් හා ආණ්ඩුවෙන් පිටත ජනතාවට දේශපාලන බලයක් ලැබේ. ඔවුහු පරාජිතයින් බවට පත් නොවන්නේ ඒ බලය ශක්තිමක් වන තරමට ය.

ඉන්දියාවේ එබඳු සංවිධානය වීමක් ඇත. ජනතා ව්‍යාපාර ජාතික සන්ධානය (NAPM- National Alliance of People's Movements) එම සංවිධානයයි. ඉන්දියාවේ පංචායත් ක්‍රමය ද තරමක් දුරට එවැන්නකි.

අපි **''මහපොළොව සුවපත් කරගනිමු''** යන ආදර්ශ පාඨය යොදාගනිමු. එවිට මහපොළොව විසින් සෙසු සියලු ජීවීන් සුවපත් කරනු ඇත.

**සරත් ප්‍රනාන්දු**
**උපදේශක**
**ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය**

2014-05-19